කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2022
------------------------------------------------------------------

කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, එවකට වරාය සහ මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංචලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ කාර්යයන් යකඩ පාලම් කොටස සහ අමතර මාත්‍රා අංශය ලෙස සංරචක 02 ක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 55,313 කට සමාන ජපන් යෙන් මිලියන 41,429 ක් වන අතර ඉන් රු. මිලියන 46,755 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් සැපයීමට ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි වටිනාකම වූ රු. මිලියන 8,558 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර, පිළිවෙලින් 2021 නොවැම්බර් 25 සහ 2021 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2024 ජූලි 01 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3** තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර 2022 දෙසැම්බර් 31 දිනට කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| **(i)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 39 වගන්තියට අනුව, විදේශ විනිමය අනුපාත වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ පාඩු මුදල් ප්‍රවාහයක් නොවන අතර ආරම්භක සහ අවසන් මුදල් හා මුදල් සමාන දෑ සංසන්දනය කිරීමේදී අදාළ බලපෑම වාර්තා කළ යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ විනිමය අනුපාත වෙනස්වීම් වලින් ජනනය වූ වටිනාකම ප්‍රමිතයට අනුව වාර්තා කර නොතිබුණි. | **31,640** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 55 ඡේදයේ දක්වා ඇති මාර්ගෝපදේශ මත පදනම්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ උපලබ්ධි නොවූ අලාභය දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුගත වියයුතු බව. |
| **(ii)** | ව්‍යාපෘති කටයුතු මූල්‍යණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය බැංකු දෙකකින් ලබාගත් රු. මිලියන 445.06 ක් ණය වශයෙන් ලබාදී තිබුණද, එම ණය මුදලට අදාළ ණය පිරිවැය ව්‍යාපෘතියේ ගිණුම්කරණ | | මාර්ග සංවර්ධන අධිකාරියේ වියදම් පියවීම සඳහා ලබාගත් ණය මුදලින් රු. මිලියන 445.06 ක් තාවකාලික පදනම මත අත්‍යවශ්‍ය ඉඩම් අත්කරගැනීමේ කටයුතු සඳහා ලබාදී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව |

| | | | |
|---|---|---|---|
| ප්‍රතිපත්ති අංක **04** ට අනුව ව්‍යාපෘතියේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | | විසින් ණය ලබාගෙන නොමැති බැවින් අදාල ණය පිරිවැය මෙම ව්‍යාපෘතිය යටතේ ගිණුම්තැබිය නොහැක. | කටයුතු කළයුතු බව. |

**2.2** නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| **2019** මාර්තු **15** දිනැති අංක **01/2019** දරන කළමනාකරණ චක්‍රලේඛයේ **9.3** උප වගන්තිය. | චක්‍රලේඛයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | **Covid 19** වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | මෙහෙයුම් කමිටු රැස්වීම නියමිත ආකාරයට පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **2022/2023** වර්ෂවල හඳුනාගන්නා ලද දෝෂ **16** ක් නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුවන් කටයුතු කර නොමැති අතර, ව්‍යාපෘතිය මේ සම්බන්ධයෙන් **2023** ජූනි **30** දින දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | **2023** නොවැම්බර් මස අඩුපාඩු දැනුම්දීමේ කාල සීමාව ඉකුත්වීමට පෙර සියලු දෝෂ නිවැරදි කරනු ලැබේ. | නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| රු. මිලියන **24.45** ක් වැයකර සන්නිවේදන ගොඩනැගිල්ලක් නිමකර තිබුණු අතර එම ගොඩනැගිල්ලේ මෙහෙයුම් කටයුතු සඳහා විද්‍යුත් උපකරණ ද සවි කර තිබුණි. කෙසේ වෙතත්, ගොඩනැගිල්ල සහ කැමරා පද්ධතිය **2023** ජූනි මාසය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. තවද මෙම ගොඩනැගිල්ලේ සවිකර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර දෙකක අභ්‍යන්තර කොටස් සොරුන් විසින් ගලවා අලාභහානි කර තිබු නමුත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මු.රෙ. **104** ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි. | මේ වන විට කැමරා පද්ධතිය සවිකිරීමේ කටයුතු අවසන් කර ඇත. එබැවින් කැමරා පද්ධතිය දැන් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශය විද්‍යුත් උපකරණවලට සිදු වූ හානි සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටී. මුදල් රෙගුලාසි **104** ප්‍රකාරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවර ගනු ඇත. | ගොඩනැගිල්ල අදාල කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |

## 3.3 පද්ධති හා පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (i) | ප්‍රති අපනයන ගිවිසුම යටතේ ආනයනය කළ උපකරණ, ඒවායේ වටිනාකම සහ දිනයන් ඇතුළත් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, එම උපකරණවලින් කොටසක් 2023 ජුනි මාසයේදී අපනයනය කර ඇති අතර තවත් කොටසක් රට තුළ රඳවාගෙන තිබුණි. ඒ අනුව රජයට සිදු වූ බදු අලාභය විගණනයේදී තහවුරුකරගත නොහැකි විය. | ප්‍රති අපනයන වර්ගීකරණය යටතේ මෙරටට ගෙන එන ලද ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් උපකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ආයතනික ඇපකර ඉදිරිපත් කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් නිදහස් කරන ලදී. කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම අයිතම ප්‍රති අපනයනය කරන විට ශ්‍රී ලංකා රේගුව විසින් මෙම ආයතනික ඇපකර නිදහස් කරනු ලැබේ. | අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |
| (ii) | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර, ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,134.94 ක් වැය කරමින් විවිධ පාර්ශ්වවලට අයත් ඉඩම් කට්ටි 968 කින් සමන්විත හෙක්ටයාර් 12.9 ක භූමි ප්‍රදේශයක් අත්පත් කර ගෙන තිබුණි. එහෙත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය අනුව අදාල ඉඩම් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීමට 2023 ජුනි 06 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කරන ලද බිම් කොටස් 968 න් වැඩි ප්‍රමාණයක් අනවසර පුද්ගලයින් විසින් අල්ලාගත්/පදිංචි රජයට අයත් ඉඩම් විය. එබැවින් එම රජයේ ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ කටවුතු කිරීම අවශ්‍ය නොවේ. අනෙකුත් ඉඩම් සම්බන්ධයෙන් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතු බව. |